## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

**1. ශ්‍රේණිය** :- 11 ශ්‍රේණිය **විෂය** :- නර්තනය **අදාළ සතිය** :- නොවැම්බර් මාසය 3 වන සතිය

**2.පාඩම/ ඒකකය**:-නර්තන අංග සඳහා අංග රචනය කරමු

**. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:-**

## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

**1. ශ්‍රේණිය** :- 11 ශ්‍රේණිය **විෂය** :- නර්තනය **අදාළ සතිය** :- ජනවාරි මාසය 3වන සතිය

**2.පාඩම/ ඒකකය**:-ප්‍රස්තාරකරණයේ මූලධර්ම ආශ්‍රිත ආදර්ශ ප්‍රශ්නාවලිය.

**3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:-**

**ප්‍රස්තාරකරණයේ මූලධර්ම**

**පුනරීක්ෂණ අභ්‍යාස**

1. මාත්‍රා යන්න කෙටියෙන් හඳුන්වන්න.
2. තිතක් සෑදීමට අවශ්‍ය අවම හා උපරිම මාත්‍රා සංඛ්‍යාව කියද?
3. ඔබ කැමති ඕනෑම කවි පදයක් තෝරාගෙන එහි ඇති ලඝු හා ගුරු අක්ෂර වෙන් කර දක්වන්න.
4. තිත් හා තෙයි සඳහා යෙදෙන තාල සංඥා මොනවාද?
5. ත්‍රිවිධ ලය නම් කරන්න.ඒ සඳහා භාවිතා වන වෙනත් නම් තුනක් සඳහන් කරන්න.
6. දොම් කිට කිට දොම් යන බෙර පදය ත්‍රිවිධ ලයට අනුව ප්‍රස්තාර කරන්න.
7. උඩරට නර්තන සම්ප්‍රදායේ පස් වන ගොඩ සරඹයේ කස්තිරම සුළු තනි තිතට ප්‍රස්තාර කරන්න.
8. මුසලඩි වන්නමෙ තාල රූපය ලියන්න
9. මුසලඩි වන්නමෙ බෙර පද නියමිත තාල රූපයට ප්‍රස්තාර කරන්න.

10.කුදංත ගත දොං වට්ටමේ තාල රූපය හා එය හඳුන්වන නාමය කුමක්ද?

11. කුදංත ගත දොං වට්ටමේ අඩව්ව නියමිත තාල රූපයට ප්‍රස්තාර කරන්න

12. දෙතිතේ ප්‍රභේද කියද? ඒවා නම් කරන්න

13.දෙතිතේ ප්‍රභේද වලට අදාල බෙර පදය බැගින් ලියන්න

14.දෙතිතේ තාල රූප ප්‍රස්තාරකරණයේදි යොදා ගන්නා සංකේත මොනවාද?

15.තුන් තිතේ ප්‍රචලිත තිත් ප්‍රභේද 2ක් ලියන්න

16. තුන් තිතේ තාල ප්‍රභේද වලදී භාවිත වන තාල සංඥා මොනවාද?

17.තුන් තිතේ ප්‍රභේදයකට අනුව බෙර පදයක් ප්‍රස්තාර කරන්න

- පහත තොරතුරු ආශ්‍රයෙන් කාර්ය පත්‍රිකාව සම්පූර්ණ කරන්න.

**4. ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කර ගත හැකි පොත් හා ඉගෙනුම් ආධාරක :-**

- e - නැණ පියස:- 11 ශ්‍රේණිය
- 11 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත

You tube නාලිකා :- **:-**

**5. ඉගෙනුම්ඵල:-**

විභාග ආශ්‍රිත ගැටලු සඳහා සාර්ථකව පිළිතුරු සපයයි.

- තුන් තිතේ ප්‍රභේද විස්තර කරයි.
- තුන් තිතේ ප්‍රභේද අනුව තාල තබයි.
- තුන් තිතේ ප්‍රභේද අනුව තාල තබමින් පද කියයි.

**සැකසුම:-** කෑගල්ල අධ්‍යාපන කලාපය